# දසවැනි සංවත්සර උළෙලින් . . .

විශේෂ අමුත්තා කථා කරයි.

ගොවිජනතාව සහරාව ඔබ වෙත ගෙන එන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 1982 පෙබරවාරි මස 22 වෙනි දින ගොවිකටයුතු අංශයේ අවුරුදු දහයක සේවයක් සම්පූර්ණ කළා. මෙරටේ පැවැති හා පවතින වෙනත් පර්යේෂණ ආයතන වලට වඩා වෙනත් සම්ප්‍රදයක් අනුගමනය කරමින් මෙරටේ ජනගහනයෙන් බහුතරය වන ගොවි හා ගම්බද පළාත්වල වෙසෙන ජනතාවගේ සාමාජික ප්‍රශ්න අරභයා සමාජ ආර්ථික පර්යේෂණ තුළින් ප්‍රතිපත්ති සම්පාදකයන්හට සිය සැලසුම් වලදී උප යෝගිකරගත හැකි කරුණු හා සාධක ඉස්මතු කර දීම අප ආයතනය පසුගිය දස වසර තුළ සිදුකළ ප්‍රධානතම කාර්යය උනා.




" පර්යේෂණ තොරතුරු ජනතාව වෙත
ගෙන යා යුතුය."

'දෙවො වස්සතු කාලෙන -

සස්ස සම්පත්ති හෙතුච

ඵීතො භවතු ලොකොච -

රාජා භවතු ධම්මිකො'


යන බෞද්ධ ආර්ථික හා පාලන සංස්කෘතියේ ආදර්ශ පාඨයෙන්ද ගොවි සංස්කෘතියේ විවිධ අංශ නිරූපනය කෙරෙන තරුණ කලාකරු සිවලි ඉලංග-සිංහගේ විචිත්‍ර චිත්‍රයකින්ද අලංකාර වන ආයතන නිවහන් දොරටුව අසලදී දසවැනි සංවත්සරයේ ආරම්භක උත්සවය පැවැත්වුන පෙබරවාරි 23 වැනි දින පෙර වරුවේදී කෘෂිකර්ම සංවර්ධනය හා පර්යේෂණ ඇමති ගරු ඊ. එල්. සේනායක මහතාට මල් මාලා වක් පළඳවා, ආයතනයේ පාලක මණ්ඩලයේ සභාපති රන්ජන් විජේරත්න මහතා විසින්ද සේනානායක මැතිණියට මල් කළඹක් පිළිගන්වා, ආයතනයේ සේවය කරන සුධර්මා ප්‍රනාන්දු මෙනෙවිය විසින්ද පිළිගන්නා ලදී.

ජාතික කොඩිය හා ආයතන කොඩිය එසවීමෙන් හා චිරාගත චාරිත්‍රානුකූලව පොල්තෙල් පහන දල්වීමෙන් අනතුරුව, දහවැනි සංවත්සරය නිමිත්තෙන් නිකුත් කෙරුන විශේෂ සමරු කලාපයේ පිටපත්, අමුත්තන්ට පිළිගන්වන ලදී. උත්සවය ආරම්භ කරමින් විශේෂ අමුත්තන් පිළිගත් ආයතන පාලක මණ්ඩලයේ සභාපති කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්, රන්ජන් විජේරත්න මහතා, දස වසරක් මුළුල්ලේ ආයතනයේ ඉතිහාසය මෙනෙහි කරමින් එය ලබා ඇති දියුණුව පැහැදිලි කළේය.

''ගොවිජනතාවගේ සාමාජීය ප්‍රශ්න සම්බන්ධයෙන් මෙබඳු ආයතනයක් පිහිටුවීමේ අදහස රජයේ වගකිව යුත්තන් තුළ පිළිසිඳ ගත්තේ 1968 දීය. වසර හතරක පිඹුරු පත් සකස් කිරීමෙන් අනතුරුව කොළඹ එලිබැන්ක් පාරේ නිවසකදී මෙම ආයතනය 1972 ආරම්භ කිරීමට හැකිවිය. පර්යේෂකයන් කිහිප දෙනෙකුගෙන් ආරම්භ කළ මෙම ආයතනය නිසංසල පරිසරයක අවශ්‍ය අංගෝපාංගයන්ගෙන් සමන්විත රමණීය නිවහනකින් හා සිය ක්ෂේත්‍රයන්හි අතිශයින් දක්ෂතා පිළිබිඹු කළ අංග සම්පූර්ණ කාර්ය මණ්ඩලයකින් සමන්විත දිවයිනේ ආදර්ශමත් පර්යේෂණ ආයතනයක් බවට දැන් පත්වී ඇත.''

ආයතනය ගොඩ නැංවීම සඳහා ආධාර කළ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ නේවාසික නියෝජිත වයි. වයි. කිම් මහතා ආයතනය

අධ්‍යක්ෂ ධුරයාගෙන් සංඝරත්නයට ආරාධනයක්



''වහන්ස, මේ දහම් දෙසුමට කාලයයි''.

විශේෂ අමුත්තෝ පොත් පත් ප්‍රදර්ශනය නරඹති



පර්යේෂණයන්හි දැකුම් කවුළුව

## කැමරා නෙ

# උළෙලෙ

ප්‍රසිද්ධ දේශ



'' නිසි පල ලබන්නට

'' උළෙල සාර්ථක කළ සැමට ස්තුතියි''


— මල්කාන්ති විජේතුංග මෙනවිය.



න්

# රසතැන්......


මාලාව ඇරඹේ.



පාදන සංවිධාන අවශ්‍යයයි ''




## බෞද්ධ සංස්කෘතියේ තවත් අංගයක්



පැන් වඩා පිං පිදේ.

## උළෙලේ අවසාන අංකය

සංඝගත දක්ෂිණාව පිරිනැමේ.



දුන් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියෙහි ප්‍රබල කොටස් කරුවෙකු වී ඇති බව පෙන්වා දුන්නේය.

"මා පෞද්ගලිකව දන්නා පරිදි කිරිදිඔය සංවර්ධන යෝජනා ක්‍රමය, මහවැලි හා කුරුණෑගල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම අගයමින් ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේ හා අදාල ජාතික සංවර්ධන වැයම ඉදිරියට ගෙනයාමේ අරමුණෙන් කරන ලද පර්යේෂණ වලින් විපුල පල නෙලාගත හැකිය', කිම මහතා කීවේය.

මෙතරම් විශිෂ්ඨ සේවාවක් කරන මෙම ආයතනයට ගොවිකටයුතු හා සම්බන්ධ දත්ත බැංකුවක්ද එක් විය යුතු යයි යෝජනා කළ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ නියෝජිතවරයා ඉන් අනතුරුව මෙය ආසියා හා පැසිපික් කලාපයේ අනෙකුත් රටවල් සමග සහයෝගයෙන් කට යුතු කරන 'කලාපීය මධ්‍යස්ථානයක්' බවට පත් විය යුතු බවද පෙන්වා දුන්නේය.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි නියැලී සිටින වැදගත් කොටසකට මෙම ආයතනයෙන් සිදුවූ සේවාව පිළිබඳව කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ නියෝජ්‍ය ඇමති චන්ද්‍රා බණ්ඩාර මහතා පැහැදිලි කළේය. "එම කොටස් නම් කෘෂිකර්මයේ නියැලුන බහුතරය වන යුළු ගොවීන්ය. මෙම ආයතනයේ පර්යේෂණ වලින් වගා කරන ඉඩමේ සිට අස්වැන්න අලෙවි කිරීම දක්වා කටයුතු වලට විසඳුම් සොයාදී ඇත්තේය" යිද බණ්ඩාර මහතා කීවේය.

ගතවූ දශකයෙන් වැඩි කොටසක් තුළ ආයතනයේ අධිපති පදවිය දරණ අධ්‍යක්ෂ ටී. බී. සුබසිංහ මහතා තවත් වැදගත් අංශයක් හෙළි කළේය.

"එයනම් අප ආයතනය භුක්ති විඳින ස්වාධීනත්වයයි" කී අධ්‍යක්ෂ වරයා සිය මතය සනාථ කරනුවස් උදහරණයක් ගෙන හැර දක්විය. "1979 වර්ෂයේදී මෙම ආයතනය මගින් කරන ලද පර්යේෂණයකදී 1977 දී එවකට පැවැති කෘෂිකාර්මික පළද වර්ධන කම්ටු අහෝසි කිරීමෙන් සුළු ගොවියා ඉතා අසීරු තත්වයකට පත්වූ බව අනාවරණය වුනා. මේ බව මම දැන්වූ විට එම මතය සනාථ කිරීමට හැකි දැයි ඇමතිතුමා ඇසුවා. එසේ යැයි මා පිළිතුරු දුන්නා එසේ නම් එම වාර්තාව එලෙසින්ම පළකරන ලෙස ඇමතිවරයා පැවසුවා" කී සුබසිංහ මහතා මෙම වරප්‍රසාදය ආයතනයට දිගටම හිමිවී ඇති බව රජයට හා ඇමතිවරයාට ස්තුති කරමින් පැවසීය

ආයතනයේ විශිෂ්ඨ සේවාව පිළිබඳව සිය සතුට පළකල ගරු ඇමති ඊ. එල්. සේනානායක මහතා පර්යේෂණ වලින් සොයා ගන්නා නව දැනුම ඒවා අවශ්‍ය ගොවීන් අතරට ගෙනයන ලෙස ඉල්ලා සිටියේය. රජයේ ආයතන වලින් විශාල ලෙස පත්‍රිකා මුද්‍රණයකර බෙද හරිනු වෙනුවට මෙම පර්යේෂණ තොරතුරු ජනතාවට ලබාදුන හොත් එය රටේ සංවර්ධනයට විශාල රුකුලක් වෙන බවද සේනා-නායක මහතා පෙන්වා දුන්නේය. උත්සවය නිමාවට පත්වූයේ ආයතනයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් කෙරුන ස්තුතියෙනි. එය භාරවූයේ ආයතනයේ සුභ සාධක සංගමයේ නියෝජ්‍ය සභාපතිනි පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරිනී මල්කාන්ති විජේතුංග මෙනෙවියටයි. අනතුරුව, දැනුම් පවසින් පිරුණු ජනතාව වෙනුවෙන් පැවැත්වුණු පොත්පත් ප්‍රදර්ශනයක්ද ලොවෙහි නව තාක්ෂණ දියුණුව විදහා දක්වෙන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ප්‍රදර්ශනයක්ද ඇමතිවරයා විවෘත කළේය.

ඉන් පසුව පැවති සති අන්තයේදී ගොවි සංස්-කෘතියේ තවත් අංශයක්ද මෙම උත්සව මාලාවට එක් වූයේය. ඒ, ආයතනයේ සුභසාධක සංගමයේ මෙහෙයවීමෙන් පැවැති සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව හා මහා සංඝයාවහන්සේ විෂයෙහි පිළිගැන්වුණු සංඝගත දක්ෂිණාවයි.

කාලීන සමාජ ප්‍රශ්න අරභයා විද්වතුන් ලවා ප්‍රසිද්ධ දේශන මාලාවක් ආයතනයේ ශ්‍රවනාගාරයේදී පැවැත්වීමද මෙම උත්සව මාලාවේ අංගයක් විය. "විවෘත වෙළෙඳ ප්‍රතිපත්තිය හා කෘෂිකර්මික අලෙවි ක්‍රමෝපායයන්" යන මැයෙන් පසුගිය පෙබරවාරි 11 වැනි දින වෙළෙඳ ඇමති ගරු ලලිත් ඇතුලත්මුදලි මහතා පැවැත්වූ දේශනයෙන් ඇරඹුන එම දේශන මාලාවට අනුව 18 වැනි දින සර්වෝදය සභාපති ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතා පැත්වූ "සංවර්ධ-නයට ජනතා සහයෝගය ලබා ගැනීම" මහාචාර්ය නන්දදස කෝදගොඩ මහතා 24 දින පැවැත් වූ "පෝෂණ ප්‍රතිපත්ති හා සංවර්ධනය - වෙනස් වන රටා" යන දේශනයද, මාර්තු 4 දින ආචාර්ය ජේ. විජේවර්ධන මහතා විසින් පවත්වන ලද "වියළි කලාපයේ ගොවිතැන් කිරීම 2001 දී" යන දේශනයන්ද ඇතුලත් විය.

මෙම උත්සව මාලාවේ අතිශයින් වැඩ දයක කර්තව්‍ය වන්නේ දිවයිනේ ආහාර වගා ව්‍යාපාරයට දිරිදීමේ අරමුණෙන් පැවැත්වෙන කොස් පැල දශ ලක්ෂයක් රෝපණය කිරීමේ දිප ව්‍යාප්ත වැඩ පිළිවෙලයි. කෘෂිකාර්මික රටාව අනුව අප්‍රේල් මාසයේ දී කෙරෙන තෙත් කලාපයේ කොස් පැල සිටුවීමේ ව්‍යාපාරය ආරම්භ වන්නේ ගරු. ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති තුමන්ගේ සුරතින් ජනාධිපති මන්දිර භූමි භාගයේදී කොස් පැලයක් රෝපණය කිරීමෙනි. වියලි කලාපයේ කොස් රෝපණය කිරීම ලබන ඔක්තෝබර් මාසයේදී ආරම්භ කිරීමට නියමිතය.